සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA1 විභාගය - 2016 ජනවාරි

## (AA11) මූල්‍ය ගිණුම්කරණ මූලිකයන්

(Financial Accounting Basics)

2016-02-06
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ **නොහැකි** ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්ය ප්‍රශ්න පහළොව (15) කි.

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.7 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 භාණ්ඩ ලැබීම් පත්‍රය (Goods Received Note - GRN) යනු:

(1) කරන ලද ඇණවුම් වෙනුවෙන් ගෙවීම් ඉල්ලා සිටීම පිණිස සැපයුම්කරු විසින් භාවිත කරනු ලබන උපකාරක ලියවිල්ලකි.

(2) අස්තිත්වයක් වෙත ලැබෙන භාණ්ඩ, ඒවා ලැබුණු අවස්ථාවේ දී වාර්තා කිරීම සඳහා භාවිත කරනු ලබන උපකාරක ලියවිල්ලකි.

(3) විකුණන ලද භාණ්ඩ වෙනුවෙන් ගෙවිය යුතු ප්‍රමාණයන් පියවන ලෙස ගනුදෙනුකරුවන්ට කරනු ලබන ඉල්ලීමකි.

(4) සංවිධානය තුල නිෂ්පාදන කාර්යයන් ක්‍රමානුකූලව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම පිණිස ගබඩා දෙපාර්තමේන්තුව විසින් මිලදී ගැනීමේ දෙපාර්තමේන්තුවට දන්වනු ලැබීමට භාවිත කෙරෙන අභ්‍යන්තර ලියවිල්ලකි. (ලකුණු 02)

1.2 "මූල්‍ය ගිණුම්කරණය" සහ "කළමනාකරණ ගිණුම්කරණය" අතර වෙනස නිවැරදි ලෙස විස්තර කෙරෙනුයේ පහත සඳහන් කුමන ප්‍රකාශයෙන් ද?

(1) කළමනාකරණ ගිණුම්කරණ තොරතුරු වලට වඩා මූල්‍ය ගිණුම්කරණ තොරතුරු වඩා විස්තරාත්මක වේ.

(2) කළමනාකරණ ගිණුම්කරණය ඓතිහාසික දත්ත සළකා බලන අතර මූල්‍ය ගිණුම්කරණය ඓතිහාසික මෙන්ම අනාගත දත්ත ද සළකා බලනු ලබයි.

(3) කළමනාකරණ ගිණුම් පිළියෙල කරනු ලබන්නේ සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති, ප්‍රමිත සහ නියාමන අවශ්‍යතා වලට අනුකූලව වන නමුත්, මූල්‍ය ගිණුම් පිළියෙල කරනු ලබන්නේ කළමනාකරණයේ අවශ්‍යතා පදනම් කරගෙනය.

(4) මූල්‍ය ගිණුම්කරණය මගින් මූල්‍ය ගිණුම්කරණය සඳහා වූ නියාමන රාමුව මත පදනම්ව ඇල්මැති පාර්ශවයන්ගේ (stakeholders) තොරතුරු අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස, ව්‍යාපාරයක මූල්‍ය කාර්යසාධනය සහ මූල්‍ය තත්ත්වය පළිබඳව වාර්තා කරනු ලබන අතර, කළමනාකරණ ගිණුම්කරණය මගින් එහි කළමනාකාරිත්වයට ව්‍යාපාරයේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව පිළිබඳව වඩාත් කේන්ද්‍රගත වූ (more focused) තොරතුරු සපයනු ලබයි. (ලකුණු 02)

1.3 පහත සඳහන් ඒවා අතුරෙන් නිවැරදි ගිණුම්කරණ සමීකරණය වනුයේ:

(1) වත්කම් = ප්‍රාග්ධනය + ලාභය + වගකීම්. (2) ලාභය = ආදායම් + වියදම්

(3) වත්කම් = ප්‍රාග්ධනය - ලාභය - වගකීම්. (4) වත්කම් = ප්‍රාග්ධනය = වගකීම්. (ලකුණු 02)

1.4 පහත සඳහන් ගනුදෙනු අතුරෙන් වත්කම් සහ වගකීම් යන දෙකටම බලපානු ලබන්නේ කුමන ගනුදෙනුව ද?

(1) දීර්ඝ කාලයක් හිඟව තිබූ **නිමල්ගේ** රු.10,000/- ක ගෙවිය යුතුව තිබූ මුදලක් පියවා ඇමීම.

(2) වැටුප් ගෙවීම් සහකාරගේ භාවිතය සඳහා රු.65,000/- කට පරිගණකයක් මුදල් ගෙවා මිලදී ගැනීම.

(3) රු. මිලියන 2.3 කට මෝටර් වාහනයක් විකිණීම.

(4) **ABC බැංකුවෙන්** නිකුත් කළ ණයකරවල රු.100,000/- ක් ආයෝජනය කිරීම. (ලකුණු 02)

1.5 මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පමය රාමුවට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල සංරචක (components) වලට ඇතුළත් වනුයේ:

(1) විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට සටහන් ය.

(2) වත්කම්, වගකීම්, ස්කන්ධය, ආදායම් සහ වියදම් ය.

(3) නිෂ්පාදන ගිණුම, වෙළෙඳ ගිණුම, ලාභා'ලාභ ගිණුම, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය.

(4) ජංගම නොවන වත්කම්, ජංගම වත්කම්, ජංගම නොවන වගකීම්, ජංගම වගකීම් සහ ස්කන්ධය. (ලකුණු 02)

1.6 ගිණුම්කරණ දත්ත පදනමක (database) ප්‍රධාන ගොනු (files) වර්ග සමන්විත වනුයේ:

(1) ස්ථාවර ගොනුව (Permanent file), ජංගම ගොනුව (Current file) සහ පෞද්ගලික ගොනුව (Personnel file).

(2) ප්‍රධාන ගොනුව (Master file), ගනුදෙනු ගොනු සහ වැඩ ගොනු (Working files).

(3) පොදු ලෙජර් ප්‍රධාන ගොනුව, නාමික ගිණුම් ගොනුව සහ පුද්ගල ගිණුම් ගොනුව (Personal Accounts file).

(4) තොග ප්‍රධාන ගොනුව, ණයගැති ප්‍රධාන ගොනුව, ණයහිමි ප්‍රධාන ගොනුව සහ වැටුප් (පඩිපත්) ප්‍රධාන ගොනුව. (ලකුණු 02)

**1.7** මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පමය රාමුවට අනුකූලව "වගකීම" යන පදය නිවැරදි ලෙස අර්ථකතනය කරනු ලබන්නේ පහත සඳහන් ප්‍රකාශන අතුරෙන් කුමන ප්‍රකාශනයෙන් ද?

(1) අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස පැන නැගී ඇති, පියවා දැමීමේදී ආයතනයේ සම්පත් වලින් පිටතට ගැලීමක් අපේක්ෂා කරනු ලබන, ආයතනය සතු වර්තමාන බැඳීමකි.

(2) අතීත සිදුවීම් වල ප්‍රතිඵලයක් ලෙස ආයතනයේ සම්පත් වලින් මුදල් පිටතට ගලා යෑමකි.

(3) අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස පැන නැගී ඇති, පියවා දැමීමේදී ආයතනයේ සම්පත් වලින් පිටතට ගලා යෑමක් අපේක්ෂා කරනු ලබන, ආයතනය සතු අනාගත බැඳීමකි.

(4) අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස පැන නැගී ඇති, පියවා දැමීමේදී ආයතනයේ සම්පත් වලින් පිටතට ගලා යෑමක් අපේක්ෂා කරනු ලබන, ආයතනය සතු විය හැකි බැඳීමකි (probable obligation). (ලකුණු 02)

*අංක 1.8 සිට 1.15 දක්වා ප්‍රශ්න වලට නිවැරදි උත්තර, ප්‍රශ්න අංකය සමග උත්තර පොතේ ලියන්න.*

**1.8** පහත දැක්වෙන ගනුදෙනු වලින් ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම (වැඩිවීමක් ද / අඩුවීමක් ද යන්න) **සඳහන් කරන්න**:

| ගනුදෙනුව | වත්කම් = ස්කන්ධය + වගකීම් |
|---|---|
| (a) ණයට තොග මිලදී ගැනීම | |
| (b) භාණ්ඩ ණයට විකිණීම (ලාභයක් ඇතිව) | |

(ලකුණු 02)

**1.9** පහත සඳහන් එක් එක් ගනුදෙනුව සඳහා ද්විත්ව සටහන සඳහන් කරන්න.

(a) ණය පදනම මත රු. මිලියන 3.5 කට මෝටර් වාහනයක් මිලදී ගැනීම.

(b) රු.10,000/- ක ණයට විකිණීමක් සඳහා, රු.2,000/- ක වට්ටමක් අඩු කිරීමෙන් පසු ගනුදෙනුකරුවෙකුගෙන් මුදල් ලැබීම.

(c) අයිතිකරු විසින් ව්‍යාපාරය සඳහා හඳුන්වාදෙන ලද ප්‍රාග්ධනය රු.100,000/- කි. (ලකුණු 06)

**1.10** සම්ප්‍රදායික වර්ගීකරණය මත පදනම්ව ලෙජර් ගිණුම් වර්ගීකරණය කර එක් එක් වර්ගය සඳහා උදාහරණය බැගින් දක්වන්න. (ලකුණු 03)

**1.11** විශ්වසනීයව දක්වා ඇති තොරතුරු (faithfully represented information) වල ඇතැම් විශේෂ ලක්ෂණ ගැබ්ව තිබේ. විශ්වසනීයව දක්වා ඇති තොරතුරු වල ඇතුලත් එබඳු විශේෂ ලක්ෂණ තුනක්(03) ලැයිස්තුගත කරන්න. (ලකුණු 03)

**1.12** "වත්කම" යන පදය නිර්වචනය කරන්න. (ලකුණු 03)

**1.13** ගිණුම්කරණ පද්ධතිය පරිගණකගත කර ඇති විට අස්තිත්වයකට මුහුණපෑමට සිදුවිය හැකි අවාසි තුනක්(03) ලැයිස්තුගත කරන්න. (ලකුණු 03)

**1.14** **සමන්ගේ** ව්‍යාපාරයේ 2015 ජනවාරි 01 දින ආරම්භක ශුද්ධ වත්කම් රු.175,000/- ක් ද, 2015 දෙසැම්බර් 31 දින අවසාන ශුද්ධ වත්කම් රු.350,000/- ක් ද තිබුණි. මෙම කාලපරිච්ඡේදය තුළදී ව්‍යාපාරය රු.75,000/- ක ලාභයක් ඉපැයූ අතර **සමන්ගේ** පුද්ගලික පරිහරණය සඳහා ඔහු විසින් රු.50,000/- ක් ආපසු ගෙන තිබුණි.

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී **සමන්** විසින් ව්‍යාපාරයට අළුතෙන් යෙද වූ අතිරේක ප්‍රාග්ධනය ගණනය කරන්න. (ලකුණු 03)

1.15 *පහත සඳහන් එක් එක් ප්‍රකාශයන් **සත්‍ය** හෝ **අසත්‍ය** යන්න සඳහන් කරන්න. සත්‍ය හෝ අසත්‍ය යන්න ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

(a) පෙර ඉන්වොයිසියක තිබූ කොන්දේසි යටතේ, ගැනුම්කරු විසින් විකුණුම්කරුට ගෙවීමට තිබූ ප්‍රමාණය අඩුකර, භාණ්ඩ විකුණුම්කරුවෙකු විසින් ගැනුම්කරු වෙත බැරපතක් නිකුත් කරන් ලැබේ. (ලකුණු 01)

(b) ද්‍රව්‍ය අධියාචනා /ඉල්ලුම් පත්‍රය (Material Requisition Note - MRN) යනු මිලදී ගැනුම් දෙපාර්තමේන්තුව විසින් සැපයුම්කරුවන්ගෙන් අයිතම ඉල්ලුම් කිරීම සඳහා භාවිත කරන ලියවිල්ලක් වේ. (ලකුණු 01)

(c) ගිණුම්කරණ දර්ශනය (accounting perspective) අනුව, පඩිපත (payroll) යනුවෙන් හැඳින්වෙන්නේ එක්තරා කාලපරිච්ඡේදයක් තුළ සේවකයින් විසින් සපයන ලද සේවා වෙනුවෙන් ඔවුන්ට ගෙවන ලද ප්‍රමාණයයි. (ලකුණු 01)

*A කොටසෙහි අවසානය*

## <u>B කොටස</u>

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 40)

## 02 වන ප්‍රශ්නය

(a) **කැලුම්** මෑතදී වෘත්තිය සුදුසුකම් ලැබූ වාස්තු විද්‍යාඥයෙක් වන අතර ඔහු තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කර සිටී. ඔහුට ගිණුම්කරණය පිළිබඳ දැනුම් පසුබිමක් නොවිය. එබැවින්, "අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය" (Going Concern Concept) සහ "උපචිත සංකල්පය" (Accrual Concept) පිළිබඳ අවබෝධ කර ගැනීම සඳහා ඔබගේ උපදෙස් බලාපොරොත්තු වේ.

**ඔබ විසින් කළ යුතු දෑ,**

ඉහත දැක්වූ එක් එක් සංකල්පයේ අදහස **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) **ශාන්ති ට්‍රේඩර්ස්** හි 2016 ජනවාරි මාසයේ පළමු දෙසතිය තුල වූ සුළු මුදල් ගනුදෙනු වලින් උපුටා ගැනීමක් පහතින් දක්වා ඇත. **ශාන්ති ට්‍රේඩර්ස්** රු.5,000/- ක සුළු මුදල් අග්‍රිමයක් පවත්වාගෙන යනු ලැබේ:

| ජනවාරි | විස්තරය |
|---|---|
| 01 | සුළු මුදල් ප්‍රතිපූරණය සඳහා ප්‍රධාන අයකැමිගෙන් රු.3,500/- ක් ලැබුණි. |
| 02 | අළුත් අවුරුද්ද සැමරීම සඳහා වියදම් - වවුචර් අංක 1 - රු.1,400/-. |
| 03 | ලිපිද්‍රව්‍ය අයිතම මිලට ගැනීම - වවුචර් අංක 2 - රු.560/-. |
| 06 | මුද්දර සහ ලියුම් කවර සඳහා ගෙවීම - වවුචර් අංක 3 - රු.250/-. |
| 07 | පුණ්‍යායතනයක් සඳහා ප්‍රදානය - වවුචර් අංක 4 - රු.150/-. |
| 09 | පවිත්‍ර කිරීම සඳහා සෝමදාසට ගෙවීම - වවුචර් අංක 5 - රු.600/-. |
| 11 | බස් ගාස්තු ගෙවීම - වවුචර් අංක 6 - රු.50/-. |

2016 ජනවාරි 15 වන දින ප්‍රධාන අයකැමි විසින් සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ,**

ඉහත සඳහන් ගනුදෙනු **ශාන්ති ට්‍රේඩර්ස්** හි සුළු මුදල් පොතේ **සටහන් කරන්න**.

*සටහන: සුළු මුදල් වියදම්: ලිපිද්‍රව්‍ය වියදම්, ගමන් වියදම්, තැපැල් ගාස්තු, පවිත්‍රතා වියදම් සහ වෙනත් වියදම් යටතේ වර්ගීකරණය කරන්න.* (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

ලිපිද්‍රව්‍ය අයිතම විකිණීම සඳහා 2014 ජනවාරි 01 දින **මහේෂ්** තනි පුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි.

ඔහුගේ ව්‍යාපාරයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ශේෂපත්‍රය) පහත දැක්වේ:

**2014 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| | (රු.) |
|---|---|
| **ස්ථාවර වත්කම්:** | |
| බෙදාහැරීමේ වෑන් රථය | 500,000 |
| **ජංගම වත්කම්:** | |
| වෙළෙඳ ණයගැතියෝ | 800,000 |
| අතැ'ති මුදල් | 750,000 |
| | **2,050,000** |
| **ප්‍රාග්ධන ශේෂය** | 1,475,000 |
| **ජංගම වගකීම්:** | |
| වෙළෙඳ ණයහිමියෝ | 575,000 |
| | **2,050,000** |

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් පොතේ සාරාංශය පහත පරිදි විය:

**2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් පොත**

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ ශේෂය | 750,000 | ගැනිලි | 250,000 |
| ණයගැතියන්ගෙන් ලැබීම් | 1,250,000 | ණයහිමියන්ට ගෙවීම් | 865,000 |
| | | ගෙවල් කුලී | 137,500 |
| | | ඉන්ධන වියදම් | 12,000 |
| | | විදුලිය | 27,000 |
| | | වැටුප් | 240,000 |
| | | ප/ගෙ ශේෂය | 468,500 |
| | **2,000,000** | | **2,000,000** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) භාණ්ඩ බෙදාහැරීමේ වෑන් රථය **මහේෂ්** විසින් 2014 දෙසැම්බර් 31 දින මිලදී ගත් අතර, වාහන සඳහා අදාල වන ක්ෂය අනුපාතිකය 10% කි.

(2) ලිපිද්‍රව්‍ය වෙළෙඳසැල ඔහුගේ හොඳම මිත්‍රයෙකුට අයිති ගොඩනැගිල්ලක ආරම්භ කරන ලද අතර, ඔහු මසකට රු.12,500/- බැගින් වූ ගෙවල් කුලියකට එකඟ විය.

(3) **මහේෂ්** සියලුම ගනුදෙනු ණය පදනම මත සිදු කළ අතර, වර්ෂ අවසානය වන විට ඔහුගේ තොග සියල්ලම විකිණීමට ඔහුට හැකි වූ බැවින් වර්ෂය අවසානයේ දී ඉතිරි වූ තොග කිසිවක් ඔහු වෙත නොවීය.

(4) 2015 දෙසැම්බර් මාසය සඳහා වන රු.2,200/- ක් වූ විදුලි බිල්පත **මහේෂ්** විසින් 2016 ජනවාරි මාසයේදී ගෙවන ලදි.

(5) 2015 දෙසැම්බර් 31 දිනට, පහත සඳහන් ශේෂයන් **මහේෂ්ගේ** ව්‍යාපාරයේ පොත්වල පෙන්නුම් කරන ලදි:

වෙළෙඳ ණයගැතියෝ : රු.600,000/-

වෙළෙඳ ණයහිමියෝ : රු.660,000/-

**ඔබ විසින් කළ යුතු දෑ,**

**මහේෂ්ගේ** වෙළෙඳ ව්‍යාපාරය සඳහා 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

**එවරස්ට් ට්‍රේඩින් සමාගමේ** 2015 මාර්තු 31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම එකඟ නොවිය. වෙනස වූ රු.505,500/- අවිනිශ්චිත ගිණුමකට හර කරන ලදී. ඊට පසු අවසන් ගිණුම් පිළියෙල කරන ලද අතර කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ ලාභය රු.12,657,300/- ක් ලෙස හඳුනාගන්නා ලදී. කරුණු පරීක්ෂා කර බැලීමෙන් පසු පහත දැක්වෙන දෝෂ හඳුනාගන්නා ලදී:

(1) රු.51,000/- ක් වූ මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ පිරිවැය සමාගම විසින් ප්‍රාග්ධනීත (capitalized) කර තිබුණි.

(2) ගනුදෙනුකරුවෙකු විසින් බැංකුවේ කෙලින්ම තැන්පත් කළ රු.123,000/- ක් පොළී ආදායමක් ලෙස සලකා තිබුණි.

(3) දෛනික විකුණුම් පොත රු.525,000/- ක් අඩුවෙන් එකතු කර තිබුණි.

(4) ගනුදෙනුකරුවෙකුට දෙන ලද රු.64,000/- ක වට්ටමක් වෙළෙඳ ලැබිය යුතු දෑ ගිණුමේ නිවැරදිව සටහන් කර තිබුණි. එසේ වුවද, එය ලද වට්ටම් ගිණුමට රු.46,000/- ක් ලෙස හර කර තිබුණි.

(5) විවිධ වියදම් ගිණුමේ ශේෂය වූ රු.1,125,000/- ක් ශේෂ පිරික්සුමට ගෙන තිබුණේ රු.112,500/- ක් ලෙස ය.

**ඔබ විසින් කළ යුතු දෑ,**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ඉහත දෝෂ නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ජර්නල් සටහන්. (ලකුණු 05)

(b) අවිනිශ්චිත ගිණුම. (ලකුණු 02)

(c) සංශෝධිත ශුද්ධ ලාභය පෙන්වන ප්‍රකාශනය. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

පහත සඳහන් තොරතුරු මොරටුවේ ස්ථානගතකර ඇති තනි පුද්ගල ව්‍යාපාරයක් වන **සේෆ්ටි ෆස්ට් ට්‍රේඩර්ස්** සඳහා අදාල වේ. ඉදිකිරීම් කර්මාන්තය සඳහා යෝග්‍ය ආරක්ෂිත ජැකට් (safety jackets) එහි ප්‍රධාන වශයෙන් නිෂ්පාදනය කෙරේ.

(1) 2015 අප්‍රේල් 01 දිනට එහි තිබූ තොග පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි විය:

| **තොග වර්ගය:** | **රු.** |
|---|---|
| අමුද්‍රව්‍ය - රෙදි | 2,715,000 |
| අමුද්‍රව්‍ය - අමතර දෑ (accessories) | 1,252,000 |
| ආරම්භක නොනිමි වැඩ | 325,000 |
| නිමි භාණ්ඩ (ආරක්ෂිත ජැකට් 1,200 ක් කම්හල් පිරිවැයට) | 1,260,000 |

(2) 2015 ජුනි 30 දිනෙන් අවසන් පළමු කාර්තුව සඳහා එහි අමුද්‍රව්‍ය මිලදී ගැනීම් පහත පරිදි විය:

| **අමුද්‍රව්‍යය** | **රු.** |
|---|---|
| රෙදි | 3,549,000 |
| අමතර දෑ | 2,125,000 |

(3) පළමු කාර්තුව සඳහා අදාල වන වක්‍ර නිෂ්පාදන කාර්යය මණ්ඩලයේ වැටුප් පහත සඳහන් පරිදි විය:

| සේවක වර්ගය: | රු. |
|---|---|
| නිෂ්පාදන විධායකවරුන් | 225,000 |
| නිෂ්පාදන විධායකවරුන් නොවන සේවකයන් | 325,000 |
| | **550,000** |

(4) සෘජු වේතන, නිෂ්පාදනය කරනු ලබන ආරක්ෂිත ජැකට් ගණන පදනම් කරගෙන ගෙවනු ලබන අතර, විස්තර පහත සඳහන් පරිදි වේ:

| සේවක වර්ගය | නිෂ්පාදනය කළ ජැකට් එකකට (රු.) බැගින් |
|---|---|
| යන්ත්‍ර ක්‍රියාකරුවන් | 125 |
| අත් උදව්කරුවන් | 25 |
| ඇසුරුම් කාර්ය මණ්ඩලය | 25 |

(5) පළමු කාර්තුව සඳහා දරණ ලද සෘජු වෙනත් වියදම් - රු.1,025,000/- කි.

(6) **සේෆ්ටි ෆස්ට් ට්‍රේඩර්ස්** පළමු කාර්තුව තුළ ජැකට් 12,500 ක් නිෂ්පාදනය කරන ලදි.

(7) ප්‍රාග්ධන වත්කම් සඳහා වාර්ෂික ක්ෂය වීම් පහත සඳහන් පරිදි විය:

| | රු. |
|---|---|
| යන්ත්‍ර | 2,400,000 |
| කර්මාන්තශාලා ගොඩනැගිල්ල | 3,000,000 |

ගොඩනැගිල්ලේ බිම් වර්ගඵලයෙන් (floor area) ¼ ක් ගබඩාව සඳහා භාවිත කෙරේ.

(8) පළමු කාර්තුව සඳහා නිෂ්පාදනයට අදාල අනෙකුත් වියදම් රු.1,350,000/- ක් විය.

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

- 2015 ජුනි 30 දිනට අවසාන තොග පහත පරිදි විය:

| | රු. |
|---|---|
| අමුද්‍රව්‍ය - රෙදි | 1,025,000 |
| අමුද්‍රව්‍ය - අමතර දෑ | 875,000 |
| අවසන් නොනිමි තොග (75% ක් සම්පූර්ණ කරන ලද) | 790,000 |

- **සේෆ්ටි ෆස්ට් ට්‍රේඩර්ස්,** කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය කරන ලද ආරක්ෂිත ජැකට්, පිරිවැය මත 20% ක ලාභාන්තිකයක් තබාගෙන, ඔවුන්ගේම විකුණුම් අංශයට මාරු කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ,**

2015 ජුනි 30 දිනෙන් අවසන් පළමු කාර්තුව සඳහා **සේෆ්ටි ෆස්ට් ට්‍රේඩර්ස්** හි නිෂ්පාදන ගිණුම **පිළියෙල කරන්න**.

(ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්යය ප්‍රශ්න එක (01) කි.

(මුළු ලකුණු 20)

### 06 වන ප්‍රශ්නය

**ස්ටාර් බාත් එන්ටප්‍රයිසස්** හි 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම පහතින් දක්වා ඇත. **ස්ටාර් බාත් එන්ටප්‍රයිසස්, නිමල්ට** අයිති තනි පුද්ගල වෙළෙඳ ව්‍යාපාරයකි.

**2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| විස්තරය | හර | බැර |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට: | | |
| ඉඩම සහ ගොඩනැගිල්ල (ඉඩමේ අගය රු.3,000,000/-) | 10,000 | |
| මෝටර් වාහන | 5,500 | |
| ලී බඩු සහ සවිකිරීම් | 3,500 | |
| 2015 ජනවාරි 01 දිනට, සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිල්ල | | 1,200 |
| මෝටර් වාහන | | 1,500 |
| ලී බඩු සහ සවිකිරීම් | | 750 |
| 2015 ජනවාරි 01 දිනට, තොගය | 650 | |
| 2015 ජනවාරි 01 දිනට, අඩමාණ ණය සඳහා වෙන් කිරීම | | 32 |
| 2015 ජනවාරි 01 දිනට, ප්‍රාග්ධනය | | 13,900 |
| ගැනිලි | 150 | |
| විකුණුම් ආපසු එවුම් | 150 | |
| ගැනුම් ආපසු එවුම් | | 80 |
| වෙළෙඳ ණයගැතියෝ / වෙළෙඳ ණයහිමියෝ | 3,700 | 2,183 |
| අතැ'ති මුදල් | 2,500 | |
| බැංකු අයිරාව | | 110 |
| උපදේශන ගාස්තු - ව්‍යාපාර සංවර්ධන නිලධාරි | 210 | |
| බැංකු ණය | | 3,100 |
| හානි වූ තොග | 185 | |
| වැටුප් සහ වේතන | 1,410 | |
| විකුණුම් කොමිස් | 535 | |
| ගැනුම් / විකුණුම් | 22,000 | 30,000 |
| ආනයන තීරු බදු | 325 | |
| ගෙනයෑමේ කුලී | 180 | |
| විදුලිය සහ ජලය | 433 | |
| ගෙවූ වරිපනම් | 300 | |
| ප්‍රචාරණ වියදම් | 1,050 | |
| දෙන ලද වට්ටම් | 77 | |
| | **52,855** | **52,855** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2015 දෙසැම්බර් 31 දිනට අවසන් තොගය පහත පරිදි ඇගයීම් කර ඇත:

| | | |
|---|---|---|
| පිරිවැයට | - | රු.1,120,000/- |
| ශුද්ධ උපලබ්ධි වටිනාකමට (NRV) | - | රු.1,450,000/- |

(2) **නිමල්** විසින් තමාට අයිති රු.175,000/- ක් වටිනා පුද්ගලික ත්‍රිරෝද රථය 2015 දෙසැම්බර් 31 දින **ස්ටාර් බාත් එන්ටප්‍රයිසස්** වෙත, මාරු කරන ලද අතර මෙය ගිණුම් පොත්වල වාර්තා කර නොතිබුණි.

(3) 2015 ජූලි 01 දින **නිමල්** විසින් ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු.1,200,000/- ක් වටිනා මෝටර් වාහනයක් මිලදී ගෙන ඇත.

(4) ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ, සරල මාර්ග ක්‍රමය යටතේ, පිරිවැය මත පහත සඳහන් අනුපාතික භාවිත කර, එහි වත්කම් ක්ෂය කිරීම ය:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | - | 10% |
| මෝටර් වාහන | - | 20% |
| ලී බඩු සහ සවිකිරීම් | - | 25% |

(5) වර්ෂය තුළ වෙළෙඳ ණයගැතියෙකු වූ **කමල්** විසින් ගෙවීමට තිබූ ශේෂය වන රු.55,000/- ගෙවීමට නොහැකි බව දන්වන ලදුව **නිමල්** විසින් එම ශේෂය ලියාහැරීමට තීරණය කරන ලදී.

(6) ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ වෙළෙඳ ණයගැතියන්ගේ ශේෂය මත, 5% ක අඩමාණ ණය ප්‍රතිපාදනයක් සැලසීම ය.

(7) ව්‍යාපාරය පුළුල් කිරීමට **නිමල්ට** අවශ්‍යව තිබූ නිසා, කොන්ත්‍රාත් පදනම මත ව්‍යාපාර සංවර්ධන නිලධාරියෙකු පත්කර ගන්නා ලදී. 2015 මැයි 01 දින කොන්ත්‍රාත්තුව ආරම්භ කරන ලදී. මාසික උපදේශන ගාස්තුව රු.30,000/- ක් විය.

(8) 2015 දෙසැම්බර් මස ජල බිල්පත 2015 දෙසැම්බර් 28 වන දින ගෙවීමේදී රු.10,000/- ක් වැඩිපුර ගෙවා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ,**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න:**

(a) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය.

(b) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය. (ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **01 මට්ටම**<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැළකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **02 මට්ටම**<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| **03 මට්ටම**<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |